# වහාම සටන් විරාමයක් ඕනෑ

## බුද්ධිමත්තු ඉල්ලා සිටිති

ජාතික ප්‍රශ්නය අරබයා රජය ගෙන යමින් සිටින යුධමය විසඳුම් මාර්ගය ප්‍රතික්ෂේප කරමින් බුද්ධමතුන් රාශියක් තම මතය ඒකාබද්ධව ප්‍රකාශ කිරීමට කටයුතු කර ඇත. මේ ප්‍රකාශයෙන් මතු කරන තම ස්ථාවරය මුල් කර ඉදිරි කාලයේදී මැදහත් වීම් ගිරීමට ඔවුන් බලාපොරොත්තු වන බවද මේ "හරය" ට දැන ගැනීමට තිබේ. මෙහි පහත පළ වන්නේ එම ප්‍රකාශනය යි.

> "....ශ්‍රී ලංකාව තුළ සිදුවන පිළිකුල් සහගත මානව හිමිකම් උල්ලංඝන වලටත්, රට තුළ උන්හිටිතැන් අහිමි වූ ජනතාව විඳින අනේක විධ දුක් පීඩා වලටත් තුඩු දී ඇත්තේ තවමත් විසඳා නැති වාර්ගික ගැටළුව හා දිග්ගැස්සුනු යුධ ගැටුමයි.
>
> ජාතික ප්‍රශ්නය යුද්ධයෙන් විසැඳීමේ මං සෙවීමෙන් සිදු වන්නේ සාමය ශ්‍රී ලංකාවට මුළුමණින්ම අහිමි වී යාමයි.
>
> සාමය සඳහා මාවත වැටී ඇත්තේ එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සුළු ජාතීන් කෙරේ උපරීම ලෙස බලය විමධ්‍යගත කැරෙන බලය බෙදා ගැනීමක් තුළ පමණි.
>
> තිරසාර සාමයක් දිසාවට තැබෙන පළමු පියවර ලෙස රටේ උතුරු නැගෙනහිර අන්තර් පරිපාලන ව්‍යාහයක් ස්ථාපිත කරලීම ඉලක්ක කර ගනිමින්, සටන් විරාමයක් වහාම ක්‍රියාත්මක කොට, යුද වැදී සිටින පාර්ශව අතරේ නැවත සාකච්ඡා ආරම්භ කරන ලෙස අපි ඉල්ලා සිටිමු......"

අත්සන් කලේ - ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න, ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්, ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, වී. තිරුණාවුකරසු, මහාචාර්ය කුමාර් ඩේවිඩ්, චමිල් ජයනෙත්ති, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, මහාචාර්ය සුමනසිරි ලියනගේ, මහාචාර්ය සිවගුරු ගනේශන්, වෛද්‍ය එස්. පී. වික්‍රමසිංහ, ආචාර්ය කාමිණී කුලතුංග, මහාචාර්ය මයිකල් ප්‍රනාන්දු, වේලුපිල්ලේ කුහනේන්ද්‍රන්, කුහදාසන්, මාධ්‍යවේදී ලක්ෂ්මන් ගුණසේකර, පී. එස්. සුසෙයිදාසන්, එම්. සබ්රි, සීලන් කදිරගාමර්, ටී. වර්ධාකුමාර් යන අයයි.